කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී කොවිඩ්-19 ආසාදිතයින් සහ නිරෝධායනය කර සිටින්නන් සම්බන්ධයෙන් මාධ්‍ය මගින් සිදුකරනා ඇතැම් හැඳින්වීම් කෙතරම් සදාචාරාත්මකද යන්න අප විසින් නැවත නැවතත් ප්‍රශ්න කර තිබේ. විශේෂයෙන්ම 'කොවිඩ් කත', 'කොරෝනා කත' වැනි යෙදුම් සදාචාරාත්මක ඇසකින් බැලූ විට කෙතරම් යෝග්‍යද යන්න ගැටළුවකි. එසේම මෙවන් යෙදුම් ඔස්සේ ආසාදිතයින් සහ නිරෝධායනයට යොමු කර සිටින්නන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයකට බඳුන් වීමද නොසලකා හැරිය නොහැක. මෙවන් යෙදුම් ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 මර්දන කටයුතු වලටද යම් ආකාරයකින් බාධා පැමිණවීමයි.

එනිසා, කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී තමන් යොදාගන්නා භාෂාව සම්බන්ධයෙන් මාධ්‍ය විසින් වරක්, දෙවරක් නොව තෙවරක් සිතා බැලිය යුතු බවද අවසානයට සඳහන් කරමු.

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Lankadeepa**